## 18. ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව

## 18.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පාර්ලිමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පවත්වා නොතිබුණි. |
| පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අත් පොතෙහි 5.2.1 හි දැක්වෙන ආකෘතිය | පවත්වා නොතිබුණි. |
| බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය | යාවත් කාලීන කර නොතිබුණි. |

## 18.2 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගෙවීම් වවුචර් හා ඊට අදාල විස්තර ආදී වූ අවශ්‍ය සාක්ෂි පාර්ලිමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.25,000,000 ක මුදලකට අදාල වූ ගනුදෙනුවක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ආ)** අනුමත බඳවා ගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ පටිපාටිය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ)** මව්පිය පදනමින් බඳවා ගැනීම් පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පාර්ලිමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය සහ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා පවරා ගැනීම්වලට අදාල ලිපිවල පිටපත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 18.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

පාර්ලිමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 18.4 විසර්ජන ගිණුම

### 18.4.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.50,300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 20 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 18.5 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.242,800 ක්වූ තැන්පතු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 18.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 01601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,693,395 ක්වූ අතර, එම හිඟහිටි ශේෂවලට වර්ෂ 01 ක සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2004 වර්ෂයේ සිට විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.529,019 ක ණය ශේෂ වර්ෂ 11ක කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අය කර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ඇ) 1995 වර්ෂයේ සිට පැවත එන සේවය අත්හැර ගිය නිලධාරීන්ගෙන් එකතුව රු.947,096 ක ණය ශේෂ අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) වෙනත් ණය ශේෂ යටතේ 2006 වර්ෂයේ සිට පැවත එන රු.121,540 ක හිඟ ශේෂය අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**18.7 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

සුදුසුකම්ලත් නිලධාරීන් පත් කර අභ්‍යන්තර විගණන ඒකකය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**18.8 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2011 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

පාර්ලිමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු. 38,395,040 ක් විය.

**18.9 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 137 | 5,088,424 | බලයලත් නිලධාරීයා විසින් ගෙවීම් වවුචර 09 ක් අනුමත කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 262(2) හා 262(3) | - | ගෙවන ලද වවුචරවලට අදාල තහවුරු කරන ලියවිලිවල ගෙවන ලදී මුද්‍රාව යොදා තිබුණත්, එහි ගෙවූ දිනය හා කෙටි අත්සන යොදා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 772(3) | - | භාණ්ඩ වෙන්දේසියේදී විකුණන ලද සියලුම භාණ්ඩ දෙපාර්තමේන්තුවේ බඩු වට්ටෝරු පොත්වලින් ඉවත් කර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 3:13 ඡේදය | 436,230 | නිල වාහන අළුත්වැඩියා කිරීමේදී ගරාජය විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන්වල සාධාරණත්වය සම්බන්ධයෙන් සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. |
| (ii) | 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන චක්‍රලේඛයේ 1(iii) ඡේදය | | විශ්‍රාමිකයින් නැවත සේවයේ යෙදවීම මාස 12 ක කාල පරිච්ඡේදයකට සීමා කළ යුතු වුවත්, විශ්‍රාමිකයින් 4 දෙනෙකු එම සීමාව ඉක්මවා නැවත සේවයේ යොදවා ගෙන තිබුණි. |
| (iii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ - 4 ඡේදය | | නිලධාරීන් 57 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් ගෙවා තිබුණි. |
| (iv) | - 2(iv) ඡේදය | 206,250 | පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව නිලධාරීන් 55 දෙනෙකුට පාර්ලිමේන්තු රැස්වීම් පවත්වා තිබුණු අගෝස්තු මාසයේදී දින 05 ක් සඳහා රු.750 බැගින් ප්‍රවාහන දීමනාව ගෙවා තිබුණි. |
| (v) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 චක්‍රලේඛයේ 03 ඡේදය | - | නිලධාරීන් 14 දෙනෙකු වෙත රු.250,000 ක ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි. |

## 18.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

පාර්ලිමේන්තු නිල බැංකු ගිණුමට අමතරව වෙනත් බැංකු ජංගම ගිණුම් 03 ක 2014 දෙසැම්බර් 31 දිනට රු. 19,457,910 ක ශේෂයක් පැවතුණි. පාර්ලිමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවූ රු.201,761 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 18.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පාර්ලිමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර

පහත දැක්වේ.

(අ) පාර්ලිමේන්තුවේ නිලධාරීන් 67 දෙනෙකුගෙන් යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවක් තිබියදී රු.851,200 ක් බාහිර පාර්ශවයකට ගෙවා පාර්ලිමේන්තු ගරාජයේ කොටසක් වෙන්කිරීම හා රු.331,109 ක් එම පාර්ශවයටම ගෙවා පාර්ලිමේන්තුවේ ලිපි බෙදාහැරීමේ නිලධාරීන් සිටි කාමරයට වීදුරු 2 ක් සවි කිරීම කර තිබුණි.

(ආ) විනිශ්වයකාරවරුන්ගේ මාසික දීමනා නමින් වූ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය පදනම් කර ගෙන පාර්ලිමේන්තු නිලධාරිණියකට 2012 ජූලි මාසයේ සිට 2014 ජූලි මාසය දක්වා ගෙවල් කුලී දීමනා වශයෙන් රු.443,613 ක් එකවර ගෙවා තිබුණු අතර ඉන් පසුව මාසිකව රු.18,000 බැගින් ගෙවා තිබුණි. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනතේ දීමනා සම්බන්ධයෙන් වූ මුදල් රෙගුලාසි සකස් කිරීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභාවට බලය පවරා තිබුණත්, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සකස් කර නොතිබුණි.

## 18.12 අවිධිමත් ගනුදෙනු

පාර්ලිමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු අතර, සමරු ප්‍රදර්ශන කාමරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් අදාල පෞද්ගලික ආයතනය සමග කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව තරඟකාරී මිල සැසඳීමකින් තොරව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා පෞද්ගලික ආයතනයකින් සාරි 39 ක් හා ලයිනින් රෙදි මීටර් 39 ක් රු.160,680 කට මිලදී ගෙන තිබුණි.

### (ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සිදු කර තිබුණු ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අධිකාරී බලය නොලත් ගනුදෙනු නිරීක්ෂණය විය.

(i) 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.282,100,000 ක ප්‍රතිපාදනවලින් මහා භාණ්ඩාගාරයේ අවසරයකින් තොරව නිල බැංකු ජංගම ගිණුමට අමතරව ඇති වෙනත් බැංකු ජංගම ගිණුම්වලට එම ප්‍රතිපාදන මාරු කර එම මාරු කිරීම් වියදම් ලෙස භාණ්ඩාගාරය වෙත වාර්තා කර තිබුණි. මෙම මාරු කළ මුදල්වලින් බැංකු 2 ක ස්ථාවර තැන්පත් ගිණුම් 4 ක ආයෝජන සිදු කර තිබූ අතර එම ස්ථාවර තැන්පත් ගිණුම්වල 2014 දෙසැම්බර් 31 දිනට රු.212,952,795 ක ශේෂ පැවතුණි. 2013 වර්ෂයේදී ස්ථාවර තැන්පතු කල් පිරීම නිසා රු.58,451,845 ක්ද 2014 වර්ෂයේදී තැන්පතු කල් පිරීම නිසා රු.32,433,369 ක්ද ආපසු ලබා ගෙන තිබුණි.

(ii) ඉහත ශේෂයට අමතරව වෙනත් ස්ථාවර තැන්පත් ගිණුම් 04 ක 2014 දෙසැම්බර් 31 දිනට ස්ටර්ලින් පවුම් 75,201ක් සහ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 301,010 ක ශේෂ පැවතුණි. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**18.13 විසඳා නොතිබුණු විගණන ඡේද**

---------------------------------

පාර්ලිමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නිවැරදි කිරීම් කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2013 | 1.3 (ආ) | විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම. |
| | 1.3 (ඊ) (iii) | වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අය විය යුතු වසර 16 කට වඩා පැරණි රු.91,990 ක ශේෂ අය කර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | 1.3 (ඊ) (iv) | සාමාජික ණය ලේඛනයේ නිලධාරීන් ලබා ගත් ණය වර්ග කර දක්වා නොතිබුණි. |
| | 1.5 (අ) | 2013 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| | 1.6 (අ) (i) | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් ලබා දී තිබුණි. |
| | 1.6 (අ) (i) | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, දීමනා හා නිවාඩු ආදිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සකස් කර නොතිබුණි. |
| | 1.6 (අ) (ii) | ආයතනය විසින් විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙළ කර නොතිබුණි. |
| | 1.8 | රැස්වීම් පැවැත්වෙන දිනවලදී ප.ව. 6.30 න් පසු සේවයේ යෙදෙන නිලධාරීන්ට ප්‍රවාහන දුෂ්කරතා සැලකිල්ලට ගෙන ගෙවනු ලබන ප්‍රවාහන දීමනාව නිල වාහන පහසුකම් සපයා ඇති නිලධාරීන්ටද ගෙවා තිබුණි. |
| 2011 | 1.5 (අ)(i) | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභා අනුමැතියකින් තොරව පාර්ලිමේන්තු මහලේකම් විසින් නිලධාරීන් තිදෙනෙකුට වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 14ක් ලබා දී තිබුණි. |

## 18.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 52 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 150 | 133 | 17 | - |
| (iii) | ද්විතියික මට්ටම | 207 | 183 | 24 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 470 | 454 | 16 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 73 | 78 | 02 | 07 |
| | එකතුව | 955 | 900 | 62 | 07 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට පාර්ලිමේන්තුව කටයුතු කර නොතිබුණි